FREE LAWYERS
153/20 Nawala Road, Colombo 5

2026 මැයි 3

ගරු කබීර් හෂීම් මැතිතුමා,
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ගරු සභාපතිතුමා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,

කෝට්ටේ.

ගරු සභාපතිතුමනි,

**<u>භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන 2.5 ක මංකොල්ලය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය, විදේශ සම්පත් හා රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවල දායකත්වය පිළිබඳ කෝපා කමිටුව හරහා විමර්ශනයක් සිදු කරන ලෙස ඉල්ලීමයි.</u>**

2026 අප්‍රේල් 22 දින භාණ්ඩාගාරයේ සිදු වූ ඩොලර් මිලියන 2.5 ක මංකොල්ලය පිළිබඳව ගරු ගරු කතානායකතුමන් වෙත අප විසින් පැමිණිලි කරනු ලැබීය. එම ලිපිය ලැබුණු බව හෝ මේ දක්වා අප වෙත දන්වා එවීමට කතානායකතුමන් කටයුතු කර නැත.

සිද්ධිය පිළිබඳ පාර්ලිමේන්තු විවාදයක් පැවැත්වීමට ගරු ගයන්ත කරුණාතිලක මහතා ඉදිරිපත් කළ යෝජනාව ද ආණ්ඩු පක්ෂය විසින් ප්‍රතික්ෂේප කොට ඇත.

මේ පිළිබඳ අප සංවිධානය මුදල් කාරක සභාවේ සභාපතිවරයා වෙත විවෘත ලිපියක් මගින් කරුණු ඉදිරිපත් කරනු ලැබීය. පසුගිය බ්‍රහස්පතින්දා පැවති රැස්වීමේ දී එම කරුණු සැලකිල්ලට ගනු නොලැබීය. තව ද, අප පුදුමයට පත් කරමින් අදාළ ලේඛන ලබාදීමට මාසයක කාලයක් මුදල් අමාත්‍යාංශය, භාණ්ඩාගාරය වෙත ලබා දෙන ලදී. මුදල් කමිටුව හරහා ප්‍රශ්නය මාසයකින් කල් දමාගැනීමට භාණ්ඩාගාර ලේකම්වරයාට හැකියාව ලැබුණි.

අප විසින් යොමු කරන ලද ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නය පිළිබඳ 148 ව්‍යවස්ථාව මගින් මුදල් බලතල ලබාදී ඇති පාර්ලිමේන්තුව විසින් මෙයට වඩා වැඩි කාර්ය භාරයක් ඉටු කිරීමට අවස්ථාව ඇති බව 'ෆ්‍රී ලෝයර්ස්' සංවිධානයේ අදහසයි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA - Committee on Public Accounts) හෙවත් **කෝපා** වෙත රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල මූල්‍ය විනය සහ කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීමේ වගකීම පැවරී ඇත.

<u>පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්නය කිරීම පෙන්නුම කරන කල්හි, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කරනු ලැබීම රජයේ ගිණුම් කාරක සභාවේ කාර්යයකි.</u>

ඩොලර් මිලියන 2.5 ක ගෙවීම් සම්බන්ධයෙන් දැනට සිව් දෙනෙකුගේ වැඩ තහනම් කර ඇති අතර එයින් එක් අධ්‍යක්ෂවරයෙකු මේ වන විට අවසනාවන්ත ලෙස මරණයට පත්වී ඇත.


FREE LAWYERS
153/20 Nawala Road, Colombo 5


මේ වන විට ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා පාර්ශවකරුවන් සමඟ ඇතිකර ගත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම උල්ලංඝනය වී ඇත. ණය/පොලී මුදල් ගෙවීම නියමිත දිනට සිදුවී නොමැති අතර, දින 90 ක සහන කාලය තුල ද එම මුදල් ගෙවා නැත. එය 'තාක්ෂණික මුදල් ගෙවීම් පැහැර හැරීමේ (Technical default) තත්වයකි.

එබැවින්, රාජ්‍ය මූල්‍ය වගකීම දරණ පාර්ලිමේන්තුවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ගිණුම් පිළිබඳ වගකීම දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හරහා විගණකාධිපතිවරයාගේ ද සහාය ලබාගනිමින් මේ සඳහා මැදිහත්වන ලෙස ඉල්ලමු. වහාම එළඹෙන පාර්ලිමේන්තු සතියේ දීම රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විවෘත රැස්වීමක් කැඳවා එහි අනුකමිටුවක් මගින් විගණකාධිපති සමඟ පරීක්ෂණයක් ආරම්භ කිරීමට පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

(ඇමුණුම - අත්සන සහිත පීඩීඑෆ් පිටපත අමුණා ඇත)

මෙයට විශ්වාසී,





ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න

ෆ්‍රී ලෝයර්ස් සංවිධානය

රජිත් කීර්ති තෙන්නකෝන්

පිටපත්

1. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියළුම දේශපාලන පක්ෂ නායකවරුන්/මහලේකම්වරු
2. සභාපති/පාර්ලිමේන්තු මුදල් කාරක සභාව
3. විගණකාධිපති, ජාතික විගණන කොමිෂන් සභාව